රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:206

මගේ අංකය:-2/9/277(එච්)
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1982.08.12

සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

පරම්පරාවෙන් සහ **ලියාප**දිංචියෙන් පුරවැසි යනුවෙන්
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි වෙනසක් නැතිවීම.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ V පරිච්ඡේදයේ 26(2) හා 26(3) වගන්ති මෙසේය.

"

26(2)
ශ්‍රී ලංකාවේ පුරවැසියකුට, පුරවැසිභාවය හිමි වූයේ පරම්පරාවෙන් වුවද පුරවැසිභාවය පිළිබඳ නීතියට අනුකූලව ලියාපදිංචි වීමෙන් වුවද ඒ තැනැත්තා සියලු කාර්ය සඳහා " ශ්‍රී ලංකාවේ පුරවැසියෙක්" යනුවෙන් පමණක් විස්තර කරනු ලබන්නේය.

26(3)
පුරවැසි තත්ත්වය අත්කරගනු ලැබූ ආකාරය, එනම්, පරම්පරාවෙන් ද නැතහොත් ලියාපදිංචි වීමෙන් ද යනු සලකා කවර වූ හෝ කාර්යයක් සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන් වෙසෙසා නො දැක්විය යුත්තේ ය."

02. එම නිසා රජයේ සේවයේ තනතුරු පිරවීම පිණිස ඉල්ලුම්පත් කැඳවන විට, ඉල්ලුම්කරුගේ පුරවැසි භාවය පරම්පරාවෙන් ද ලියා පදිංචි වීමෙන් ද යන්න ගැන නොවිමසිය යුතු බව කරුණාවෙන් සලකන්න.

Siriwardhana
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.